**ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලිසිය**

**------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

ශ්‍රී ලංකා පොලිසිය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිසිය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීට වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 08 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකිම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ**

------------------------------------------------------------------------------------------------------------------

**වගකීම**

**--------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව පොලිසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව පොලීසියේ  මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පොලීසියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

පොලීසිය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ---------------------------------- |
| I) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණවල වටිනාකම අනුව රු.20,657,144,308 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව වටිනාකම රු.20,735,157,567 ක් වූයෙන් රු.78,013,269 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත් අනුව වටිනාකම හා මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් සැසඳුම් කර ගිණුම් සැකසීමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය උප ගිණුම් ඒකක 47 කින් ලබා ගන්නා ලද තොරතුරු මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. විෂමතාව හඳුනා ගැනීමට ඉදිරිපත් කර ඇති දත්තවල නිවැරදිතාවය පරීක්ෂා කළ යුතුය. මෙම ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමේ හැකියාවක් නොමැති අතර අදාල විෂමතා හඳුනාගැනීමේ කටයුතු ආරම්භකර ඇත. |
| II) | 2018.12.31 දිනට භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ බැරකම් වටිනාකම රු.829,876,521 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව බැරකම් වටිනාකම රු.825,622,408 ක් වූයෙන් රු.4,194,114 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | ප්‍රාදේශීය උප ගිණුම් ඒකක 47 කින් සමන්විත ශ්‍රම ලංකා පොලීසිය අදාල උප ගිණුම් ඒකක වලින් ලබා ගන්නා ලද තොරතුරු මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම විෂමතාව හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති දත්ත වල නිවැරදිතාවය පරීක්ෂා කළ යුතුය. මෙම ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමේ හැකියාවක් නොමැති අතර අදාල විෂමතා හඳුනාගැනීමේ කටයුතු ආරම්භකර ඇත. |

1.6.2 **පොදු තැන්පතු**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. 11,503,192 ක මුදලක් අදාළ කාර්යයන් ඉටු නොකර හා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කල යුතුය. | මෙම ව්‍යාපෘතිය අවසන් නොවීම හේතුවෙන් තවදුරටත් රඳවා තබා ඇත. |
| (ආ) | අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම හේතුවෙන් නවතන ලද ව්‍යාපෘති 67 කට අදාළව පවතින බේරුම් ක්‍රියාවලිය මෙතෙක් අවසන් නොවීම නිසා නිරවුල් කිරීමට නොහැකිව තිබූ වර්ෂ 2 – 5 ත් අතර වූ ගොඩනැගිලි කොට්ඨාශය යටතේ වූ තැන්පතු වටිනාකම රු. 228,435,331 ක් විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටළු කඩිනමින් විසඳා කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කල යුතුය. | බේරුම්කරන කටයුතු අවසන්ව නොමැති බැවින් තවදුරටත් තැන්පතු ගිණුමේ රඳවා තබා ඇත. |
| (ඇ) | රාජකාරියේ නිරතව සිටියදී ආබාධිත තත්වයට පත් වූවන්ගේ සුභසාධන කටයුතු සඳහා චීන සමූහ ආණ්ඩුවෙන් ලැබී තිබුණු රු. මිලියන 4.15 ක මුදල අදාල කාර්යය සඳහා උපයෝගී කර නොගැනීම නිසා 2015 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ගිණුමක තැන්පත් කර තිබුණි. 2018 ගිණුම් වර්ෂය අවසන් වන විටත් එම පරිත්‍යාගය අපේක්ෂිත කාර්යය සඳහා උපයෝගි කර නොතිබුණි. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කල යුතුය. | 2019 වර්ෂය තුල මෙම මුදල් යොදවා අපේක්ෂිත කාර්යය සිදු කිරීමට කටයුතු කරමින් පවතී. |

1.6.3 **ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3.8 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2019 ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 ජූනි 30 දින වන විටත් බස්නාහිර සහ උතුරු පළාත්වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ අවසන්කර වාර්තා ඉදිරිපත්කල යුතුය. | උතුරු පළාතේ නිලධාරීන්ගේ හිඟතාවය හේතුවෙන් නියමිත කාල සීමාව තුල අවසන් කිරීමට නොහැකි විය. සියයට 50 ක පමණ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. සමීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2019 අගෝස්තු 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

1.6.4 **අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,084,624,217 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.999,885,638 ක් විය. ඒ අනුව රු.84,738,579 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මෙම වෙනස දීර්ඝ කාලයක සිට පැවති අතර ණය ශේෂ සටහන් කිරීමේ දෝෂ හා අත්හැරීමේ දෝෂ සිදුවී ඇති අතර වෙනස හඳුනාගෙන තිබුණද නිවැරදිව සියලු තොරතුරු හඳුනා ගැනීමෙන් අනතුරුව හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සිදු කරයි. |
| (ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිටි තිබුණු නිළධාරීන් 4,073 කින් අයවිය යුතු ශේෂ වල එකතුව රු. 88,696,932 ක් වූ අතර වර්ෂ 03ට වැඩි හිඟ හිටි ණය ශේෂවල එකතුව රු. 60,796,844 ක් තිබුණත් එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි. | හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | තොරතුරු කොට්ඨාශ මට්ටමින් නොපමාව සොයා නිරවුල් කිරීමට ගණකාධිකාරින් හා කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇත්තේ ණය අයකර ගැනීමේ කමිටු දැනුවත් කර ඇත. |

1.6.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2019 ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | 2019 ජුනි 30 දින වන විටත් බස්නාහිර සහ උතුරු පළාත්වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ අවසන්කර වාර්තා ඉදිරිපත්කල යුතුය. | උතුරු පළාතේ නිලධාරීන්ගේ හිඟතාවය හේතුවෙන් නියමිත කාල සීමාව තුල අවසන් කිරීමට නොහැකි විය. සියයට 50 ක පමණ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. සමීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2019 අගෝස්තු 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබූ රු.2,618,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,189,483,575 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් සියයට 20 සිට සියයට 84 දක්වා පරාසයන් ගෙන තිබුණි. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කල යුතුය. | අක්මුදල් නොලැබීම, අමාත්‍යාංශය වෙනස්වීම, විශේෂඥ සභාය නියමිත දිනට නොලැබීම වැනි විවිධ ගැටළු ඉතිරිවීම්වලට හේතු විය. |
| (ආ) මූලධන වැය විෂයයන් 05 කට රු.745,000,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ අතර එම ප්‍රතිපාදනයෙන් රු.704,360,041 ක් ඉතිරි වී තිබුණි. | පරිපූරක ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. | අක්මුදල් නොලැබීම, අමාත්‍යාංශය වෙනස්වීම ප්‍රසම්පාදන කමිටු පිහිටුවීමේ ගැටළු, විශේෂඥ සහාය නියමිත දිනට නොලැබීම වැනි විවිධ ගැටළු හේතුවෙන් |

| | | |
|---|---|---|
| ඉතිරිවීම් පරාසය සියයට 60 සිට සියයට 100 දක්වා විය. | | කොන්ත්‍රාත් නිම කිරීමට පමා වීම ඉතිරිවීම්වලට හේතු විය. |

**3- මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයේ වරදකරුවන් වන තැනැත්තන්ට අදාළව පොලිස් ස්ථාන මඟින් පවත්වාගෙන යනු ලබන පෙර වැරදි ලේඛන පොලිස් ස්ථාන 22 ක පෙර වැරදි ලේඛන පරිගණක ගත කර නොතිබුණි. එම වැරදිකරුවන්ගේ නමට අදාළ ඉංග්‍රීසි අක්ෂරය පදනම් කරගනිමින් ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර සමහර අක්ෂරයන්ට අදාළ වැරදි කරුවන්ගේ නම් 2000-3000 ඉක්මවූ අවස්ථාද පැවතුණි. මේ නිසා ක්ෂණිකව පුද්ගලයෙකුගේ පෙර වැරදි හඳුනා ගැනීම සහ සෙසු පොලිස් ස්ථානවලද පෙර වැරදි පවතීද යන්න පරීක්ෂා කිරීමේ හැකියාවක් නොතිබුණි. | පරිගණක ගත කිරීමට කටයුතු කල යුතුය. | මේ සම්බන්ධව අධ්‍යානයක් සිදුකර පෙර වැරදි ලේඛන පරිගණක ගත කිරීම සම්බන්ධව සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට අපේක්ෂා කරමි. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනතේ V කොටසේ ඇතුලත් "මුදල්" සම්බන්ධ කටයුතු වලට අදාල "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" හා පනතේ ඊට අදාල 22 සිට 28 වගන්තිවලට අනුව කටයුතු කළ යුතු වුවත් මීගමුව පොලිස් කොට්ඨාශය යටතේ අභ්‍යාස ආයතනය කටයුතු සිදුකර තිබුණි. | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2019 වර්ෂයේ සිට පනත ප්‍රකාරව කටයුතු කරමි. |

3.3 **කළමනාකරණ දුර්වලතා**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පොලිස් නියෝග B – 9 අනුව පොලිස් ස්ථාන ආරම්භ කිරීමේදී ඉදිරිපත් කරනු ලබන කරුණු මත ශ්‍රේණිගත කරන නමුත් මේ සඳහා පැහැදිලි නිර්ණායක පිළියෙල කර නොතිබුණි. | නිර්ණායක සකස් කල යුතු වීම. | පොලිස් ස්ථාන ශ්‍රේණි ගතකිරීම සම්බන්ධව නිර්ණායක මේ වන විට සකස් කරමින් පවතින අතර එම නිර්ණායක විද්වත් කමිටුවකට ඉදිරිපත් කර සමාලෝචනයක් සිදු කිරීමෙන් අනතුරුව ප්‍රකාශයට පත් කරමි. |
| (ආ) පොලිස් ස්ථානය පිහිටුවන අවස්ථාවේ ශ්‍රේණිගත කිරීමෙන් පසු නැවත සමාලෝචනය සිදු කර නොතිබුණද, එම ශ්‍රේණිය පදනම් කර ගනිමින් පොලිස් ස්ථානාධිපති දීමනාව හා සංග්‍රහ වියදම් දීමනාව මාසිකව ගෙවීම සිදු කර තිබුණි. | කාලීනව සමාලෝචනය සිදු කර ඒ අනුව දීමනා ගෙවිය යුතු වීම. | පොලිස් ස්ථාන නව ශ්‍රේණිගත කිරීම් සම්බන්ධ ගැසට් නිවේදනය ඉදිරිපත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී ඒ අනුව වර්තමානයට උචිත පරිදි පොලිස් ස්ථානාධිපති දීමනාව හා සංග්‍රහ වියදම් දීමනා ලබා ගැනීමේ හැකියාව පවතී. |
| (ඇ) වටිනාකම රු.මිලියන 17.53 ක් වූ තොග අයිතම 05 කට අයත් ඒකක 8,873 ක තොග හානි වීම් ද ,වටිනාකම රු.මිලියන 27.76 ක් වූ තොග අයිතම 08 කට අයත් ඒකක 103,660 ක ඌනතාවයක් ද, වටිනාකම රු.මිලියන 22.48 ක් අයිතම 05 කට අයත් ඒකක 11,499 ක් සහ වටිනාකම රු.මිලියන 21.02 ක් වූ කාකි රෙදි මීටර් 61,000 ක පමණ අතිරික්තයක් ද නිරීක්ෂණය විය.මේ සම්බන්ධයෙන් සිදු කෙරෙන පරීක්ෂණ අවසන්ව නොතිබුණි. | පරීක්ෂණ කඩිනමින් අවසන්කර වාර්තා පදනම්කර ගනිමින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සිදුකරන පරීක්ෂණයන්හි ප්‍රගතිය පසුව වාර්තා කරමි. |
| (ඈ) 2017 වර්ෂයේදී හෙරොයින් හා ගංජා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව පිළිවෙලින් 29,288 ක් හා 51,788 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් 40,987 ක් හා 54,685 ක් දක්වා වර්ධනය වී තිබුණි. | වැටලීම් සාර්ථකව සිදුකිරීමට සමගාමීව භාවිතය අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

3.4 **ප්‍රසම්පාදනය**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2016-2018 මධ්‍යකාලීන අයවැය රාමුව තුල ඉදි කිරීම් ව්‍යාපෘති 04 ක් සඳහා රු.මිලියන 341.09 ක් වැය කර තිබුණද ව්‍යාපෘති 04 අවසන් කර නොතිබුණි. | නියමිත කාල පරිච්ඡේදය තුල ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) 2017 නොවැම්බර් 15 දින රු. මිලියන 482.42 කට ඉදිකිරීම් ගිවිසුමකට එළඹ තිබූ කොළඹ කුමාරරත්නම් මාවතේ පිහිටි විවාහක නිල නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2019 මැයි මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රමාදය පිළිබඳව කඩිනම් හා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු ලබාදී නැත. |

3.5 **අනාර්ථික ගණුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2015 දෙසැම්බර් 10 දිනැති හා අංක අමප/15/1707/741/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය අනුයුක්ත කල සේවකයන් සඳහා ගෙවූ වැටුප් පොලිසිය විසින් ප්‍රතිපූර්ණය කර ගත යුතු වුවත් 2018 වර්ෂයේදී රු. මිලියනන 15.21 ගෙවා තිබුණද එම මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. | ප්‍රතිපූර්ණය සඳහා සෑම මසකම සිදුකල ගෙවීම් විස්තර අදාල ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ඉංගිරිය නගර සංවර්ධන සැලැස්ම යටතේ 2018 මාර්තු 19 දින ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා තිබූ හෙක්ටයාර් 3.9842 ක භූමියේ ගොඩනැගිලි ඉදිකිරීමට ආරම්භ කර රු.8,895,273 ක් වැය කර තිබුණද එම කටයුතු මේ වන විට නතර කර තිබුණි. භූමිය වටා ආරක්ෂක වැටක් යොදා සීමා ලකුණු කර නොතිබූ අතර සම්පූර්ණ භූමියම වල් බිහි වී තිබුණි | භූමිය උපරිම කාර්යක්ෂම තාවයෙන් යුතුව උපයෝජනයට කටයුතු කල යුතු වීම. | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම්ගේ පැවරීම් සහතිකය අනුව හෙක්ටයාර් 3.9842 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම් කැබලි 4 ක් පවරා ඇත. මේ වන විට ඉඩම් කොටසේ රැස්කර තිබූ කසල ඉවත් කරගෙන ඇති අතර තවදුරටත් කසල බැහැර නොකරන බව පානදුර කොට්ඨාශ භාර නිලධාරී විසින් දැනුවත් කර ඇත. |
| (ඇ)පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා පොලිස් රණවිරු සුරකුම් මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා හොරණ ඇල්ලකන්ද වත්ත රබර් ඉඩමෙන් අක්කර 75 ක් 2017 පවරාගෙන තිබුණද ඉදිකිරීම් සම්බන්ධ කිසිදු කටයුත්තක් 2019 අගෝස්තු මාසය වන විටත් සිදු කර නොතිබුණි. ඉඩම එම කටයුත්තට සුදුසු ද යන්න අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. ඉඩමේ ඵලදාව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | පවරාගත් ඉඩම අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම් කොටස පැවරීමට එරෙහිව පූර්ව ගාමී බදුකරු වන කොටගල වැවිලි සමාගම අභියාචනා අධිකරණයට යාම හේතුවෙන් ඉදිරි කටයුතු නතර වී ඇත. ඉඩම වටා වැටක් ඉදිකිරීම සඳහා දල ඇස්තමේන්තුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. නඩුව පැවතීමෙන් ඵලදාව ලබා ගැනීමට නොහැකි විය. |
| (ඈ)ගාල්ල, මාතර,තංගල්ල හා ඇල්පිටිය පොලිස් අධිකාරී කොට්ඨාශවලට අයත් නිළධාරීන් 133 දෙනෙක් පමණක් නිල නිවාස ඉල්ලුම්කර තිබියදී හබරාදූව "නිල සෙවණ" නිවාස යෝජනා ක්‍රමයෙන් රු.729,600,000 කට ලබා නිවාස 192 ක් මිළදී ගැනීමට කටයුතු කර තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු.මිලියන 500 ක් අවස්ථා 05 කදී ගෙවා තිබුණද, 2019 ජුනි 18 දින දක්වා කිසිදු නිවාසයක් ශ්‍රී ලංකා පොලිසිය වෙත භාර දී නොතිබුණි. තවද නිල නිවාසයක් දීමේදී සළකා බැලිය යුතු සේවා ස්ථානයට පහසුවෙන් ළඟා වීමට ඇති හැකියාව හා අවට පොදු පහසුකම් පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | ඉල්ලුමක් නොපැවතියදී නිවාස 192ක් මිලදී ගැනීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කල යුතු අතර නිල නිවාස මිලදී ගැනීමේදී නිළධාරීන්ගේ පහසුකම් පිළිබද අවධානය යොමු කල යුතුය. | පිළිතුරු ලබා දී නැත. |

## 4. යහ පාලනය

---------------

### 4.1. අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණක තනතුර හා විගණන නිලධාරී තනතුරු 60 න් 32 ක් පුරප්පාඩුව පැවතුණ ද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම ඒකකයේ ඉහළ කාර්යය සාධනය ළඟා කර ගැනීමට බාධාවක් වී තිබුණි. | අදාල පුරප්පාඩු පිරවීමට, කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | ගණකාධිකාරී සේවයේ පවතින නිලධාරීන්ගේ හිගය හේතුවෙන් අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමේ හැකියාවක් නොපවතී. විගණන නිලධාරින් සඳහා අනුප්‍රාප්තික නිලධාරීන් ලබා දීමට නොහැකි වීම නිසා අනෙකුත් කාර්යාල වෙතින් නිලධාරීන් නිදහස් කර ගැනීමේ දුෂ්කරතා පවතී. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අනුයුක්ත කාර්ය මණ්ඩලය 97,849 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 82,596 ක් විය. ඒ අනුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 15,569 ක් හා අතිරික්ත සංඛ්‍යාව 316 ක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 361 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 947 ක්, ද්විතීක මට්ටමේ තනතුරු 13,688 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 573 ක් පුරප්පාඩුව පැවතියද ඊට බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |

| | | |
|---|---|---|
| (අ) පොලිස් නිල ඇදුම් කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 05ක් සහ පොලිස් සහායක සේවයට අයත් තනතුරු 83 කට අදාළ බඳවාගැනීමේ පටිපාටි ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සංශෝධන කර තිබුණද එම සංශෝධනයන් ඇතුලත් කර සහතික කිරීමට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල සංශෝධන ඇතුලත්කර සහතික කිරීම සඳහා කඩිනමින් ඉදිරිපත් කල යුතුය. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) පොලිසියේ නිළ ඇදුම් කාර්යය මණ්ඩලය පොලිස් ස්ථාන මට්ටමින් බෙදී ගොස් ඇති ආකාරය පිළිබඳ අනුමත සංඛ්‍යාවක් නොතිබුන අතර පොලිස් ස්ථානය ආරම්භයේදී අනුමත සංඛ්‍යාව කාලීනව සංශෝධනය නොවී තවදුරටත් පැවතීම නිසා සමහර පොලිස් ස්ථානවල අතිරික්තයක්ද සමහර පොලිස් ස්ථානවල ඌනතාවයක්ද සංඛ්‍යාත්මකව පැවතුණි. | කාලීනව සමාලෝචනය සිදුකර පොලිස් ස්ථාන මට්ටමින් සිටියයුතු කාර්ය මණ්ඩලය හදුනාගෙන අනුමත කිරීම සිදුකල යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ඇ) පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කිරීමට අපේක්ෂිත වූ කාර්යය මණ්ඩලය 351 ක් වූ නමුත් එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 245 ක් විය. ඒ අනුව පුරප්පාඩු 106 ක් වූ අතර පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |